# විවෘත සංදේශයයි

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගරු ජනාධිපතිතුමා,
ගරු අග්‍රාමාත්‍යවරයා ඇතුලු කැබිනට් මණ්ඩලය සහ සියලුම පාර්ලිමේන්තු මන්ත්‍රීන් වෙතය.

ජනාධිපති රනිල් වික්‍රමසිංහ 2023.01.15 වන දින යාපනයේ දී 13 වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය සම්පූර්ණයෙන්ම ක්‍රියාත්මක කළ යුතු බව ප්‍රකාශ කල අතර, එම සංශෝධනය වහාම ක්‍රියාත්මක කිරීම ඉන්දියාවට අතිශයින්ම වැදගත් බව ඉන්දීය විදේශ අමාත්‍ය එස්.ජේශන්කර් 2023.01.20 වන දින මෙරටදීම ප්‍රකාශ කර තිබේ.

1987 දී පළාත් සභා පිහිටුවනු ලැබුව ද පළාත් සභා සඳහා විමධ්‍යගත කර තිබෙන ඇතැම් විෂයයන් ඒවාට පවරා නොදීමට මෙතෙක් පැවති ආණ්ඩු විසින් වගබලා ගන්නා ලදී. එම බලතල අතුරින් පොලිස් හා ඉඩම් බලතල ප්‍රධාන වේ. 13 වන ව්‍යවස්ථා සංශෝධනය සම්පූර්ණයෙන්ම ක්‍රියාත්මක කිරීමේදී පොලිස් හා ඉඩම් බලතල ඇතුලු තවත් ආනුෂාංගික බලතල කිහිපයක් පළාත් සභා වලට පැවරීම සිදුවේ. එය ශ්‍රී ලංකාවේ රාජ්‍ය ආරක්ෂාවට, භෞමික අඛන්ඩතාවයට, ආර්ථික ස්වෛරීත්වයට හා සංවර්ධනයට ප්‍රබල තර්ජනයකි. අවසානයේ දී ජාත්‍යන්තර බලවේගවල සහය ඇතිව රට බෙදීමට ද හැකියාව ලැබේ.

13 වන ව්‍යවස්ථා සංශෝධනය ඉන්දියාව විසින් බලහත්කාරයෙන් අප වෙත පටවන ලද්දකි. 1972 සිට 1987 දක්වා අපගේ ව්‍යවස්ථාව පාර්ශුද්ධ ලෙසම ස්වදේශීයව සම්භවයක් ලැබූ එකක් ව පැවතිනි. 13 වන සංශෝධනයත් සමගම එකී පාර්ශුද්ධත්වය අප ව්‍යවස්ථාවෙන් ගිලිහිණි. එය ජනතාවගේ අපේක්ෂාවන්ට පටහැනිව සිදු කරන ලද්දකි.

1987.06.05 වන දින දේශීය ගුවන් සීමා උල්ලංඝනය කරමින් ඉන්දියාව ගුවනින් ආධාර හෙලුවේ ශ්‍රී ලංකාවේ විදේශ ඇමතිගේ ද, ජනාධිපතිගේ ද විරෝධය නොතකා ය. ඉන්දීය ප්‍රහාරක යාත්‍රා දේශීය මුහුදු සීමාවට ඔබ්බෙන් ස්ථානගත කර තිබුනි. එය රටේ ස්වෛරීත්වයට එරෙහිව සිදුකල තර්ජනයකි. එසේ ආක්‍රමණයක් පිළිබඳ තර්ජනය කරමින් ඉන්දියාව විසින් ශ්‍රී ලංකා රජයට ඉන්දු-ලංකා ගිවිසුමට එළඹීමට බලකරන ලදී. එම ගිවිසුමේ ප්‍රතිඵලයක් ලෙස ඉන්දීය හමුදාව මෙහි පැමිණෙන ලදී. ත්‍රිකුණාමළයේ පිහිටි තෙල් ටැංකි හා පරිශ්‍රය පාලනය කල යුත්තේ කෙසේ ද යන්න පිළිබඳව ද එම ගිවිසුමේ සඳහන්ව තිබුනි.

13 වන ව්‍යවස්ථා සංශෝධනය ඉන්දු-ලංකා ගිවිසුමේ ප්‍රතිඵලයකි. එම ගිවිසුමත්, ව්‍යවස්ථා සංශෝධනයත් කෙටුම්පත් වූයේ රහසිගතව ය. 13 වන ව්‍යවස්ථා සංශෝධනය සැබෑ ලෙසම ජනතා පරමාධිපත්‍ය බලය තුලින් බිහිවූවක් නොවේ. එවකට ජනාධිපතිව සිටි ජේ.ආර්.ජයවර්ධන විසින් පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන්ගේ ඉල්ලා අස්වීමේ ලිපි ඔහු සන්තකයේ තබා ගනිමින්, කොළඹ තරු පහේ හෝටලයක ඔවුන්ව හිරකර, පසුදින පාර්ලිමේන්තුවට රැගෙන ගොස් දැඩි මානසික බලපෑමක් ඇතිකර 13 වන සංශෝධනයට පක්ෂව ඡන්දය ලබගන්නා ලද්දේ බලහත්කාරයෙනි. ශ්‍රී ලංකාවේ විධායකයේ ප්‍රධානියා විසින් ව්‍යවස්ථාදායකය වෙත මෙවැනි බලපෑමක් එල්ල කරන ලද්දේ ඉන්දීය ආක්‍රමණයකට බියෙනි.

ඇමරිකානු රේගන් පාලනය සමග ඇතිකරගත් අවබෝධය ඇතිව, ජාත්‍යන්තර සම්මුතීන්ට හා නීතියට එරෙහිව යමින් ඉන්දියාව විසින් ශ්‍රී ලංකාවට අයුතු මැදිහත්වීමක් සිදු කරන ලදී. 1987 දි සිදුවූයේ එවැනි මැදිහත්වීමක් බව කලක් ශ්‍රී ලංකාවේ ඉන්දීය රාජතාන්ත්‍රික දූතයා ලෙසද, පසුව ඉන්දීය අග්‍රාමාත්‍යවරයාගේ ආරක්ෂක උපදේශක ලෙසද කටයුතු කල ශිවශංකර් මෙනන් විසින් 2016 දී රචනා කරන ලද "චොයිසස්" නැමැති ග්‍රන්ථයේ 132 වන පිටුවේ පැහැදිලිව සදහන් කර තිබේ. ඔහුට අනුව එම මැදිහත්වීම සිදුකර තිබෙන්නේ ශ්‍රී ලංකාව වෙනත් පාර්ශවයන්ගේ මැදිහත්වීමට ලක්වීම සඳහා ඇති සියලු ඉඩ අහුරා දැමීමේ අරමුණින් ය. ඉන්දියාව අප දේශය දැක ඇත්තේ ඉන්දියාවේ දකුණු වෙරළේ සිට සැතපුම් 14ක් එපිටින් නවතා ඇති යුධ ගුවන්යානා ගෙනයන (රඳවන) නෞකාවක් ලෙසය. "චොයිසස්" - 143 පිටුව.

ඒ අනුව 13 වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය බලහත්කාරයෙන් අපගේම පාර්ලිමේන්තුව හරහා සම්මත කරවා ගෙන තිබෙන්නේ ඉන්දියාවේ ආරක්ෂක හා ආර්ථික උපාය මාර්ගික සැලසුමක කොටසක් වශයෙනි. එම සංශෝධනය යටතේ පිහිටුවන ලද පළාත් සභා ක්‍රමය වනාහි ඉන්දියාවේ ආරක්ෂක හා ආර්ථික අභිප්‍රායන් සාක්ෂාත් කර ගැනීම සඳහා ශ්‍රී ලංකාව තුළ ක්‍රියාත්මක කරවන උපායමාර්ගික යාන්ත්‍රණයකි. එය ඊනියා ජනවාර්ගික ගැටළුවට පිළියමක් ලෙස පනවන ලද්දක් බවට කියාපෑම, හුදෙක් නීති විරෝධී ආක්‍රමණයක් සාධාරණීකරණය කිරීමට ගොතන ලද සාවද්‍ය අර්ථගැන්වීමකි.

13 වන ව්‍යවස්ථා සංශෝධන කෙටුම්පත ශ්‍රේෂ්ඨාධිකරණය හමුවේ අභියෝගයට ලක්වූ අවස්ථාවේ දී ශ්‍රේෂ්ඨාධිකරණ විනිසුරුවරුන් නව දෙනෙකුගෙන් සිව් දෙනෙකු විසින්ම තීරණය කරන ලද්දේ එය ලංකාවේ ඒකීය භාවයට තර්ජනයක් බවත්, ඒ අනුව එකී සංශෝධන සම්මත කිරීමට ජනමත විචාරණයක් අවශ්‍ය බවය.

13 වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය පූර්ණව ක්‍රියාත්මක කිරීමේ දී එක් එක් පළාතක් තුළ එකිනෙකින් වෙන්ව ක්‍රියාත්මක වන හා ප්‍රධාන අමාත්‍යවරයාට වගකියන නියෝජ්‍ය පොලිස්පතිවරයෙකු යටතේ පාලනය වන පොලිස් හමුදාවන් බිහිවේ. පළාත්බඳ පොලිස් කොමිසන් සභා ද ඇති කරනු ලබයි. මධ්‍ය රජයේ පොලිසියට ප්‍රාදේශීය වශයෙන් බලතල ක්‍රියාත්මක කිරීමේ දී දැඩි සීමා පැනවේ. මෙය රාජ්‍ය ආරක්ෂාවට සහ රට තුළ නීතියේ පාලනය ස්ථාපිත කිරීමට දැඩි අහිතකර බලපෑමක් ඇති කරයි.

එසේම එමගින් ඉඩම් බලතල ද විමධ්‍යගත වීමක් සිදුවේ. පළාත් සභාව නොවිමසා පළාතක් තුළ ඇති රජයේ ඉඩම් සම්බන්ධයෙන් තීරණය ගැනීම සඳහා ජනාධිපතිට සීමා පැනවේ. පුරාවිද්‍යාත්මක වශයෙන් වැදගත් ස්ථාන සම්බන්ධයෙන් කටයුතු කිරීමේ දී ද පළාත් සභාවට ප්‍රධාන ආණ්ඩුවෙන් ස්වාධීනව කටයුතු කිරීමට හැකි වේ.

දැනට වසර 5කට අධික කාලයක් තුළ පළාත් සභා ඡන්දයක් පවත්වා නොමැත. කිසිදු ජන කොටසක් විසින් පළාත් සභා ඡන්දයක් ඉල්ලා උද්ඝෝෂණය කර නොමැත. එසේ තිබිය දී දකුණේ හා උතුරේ වෙසෙන ජනතාවගේ කර මතින් බලයට පැමිණි බල ලෝභීන් කිහිපදෙනෙකු පමණක් තම පටු දේශපාලන අරමුණු සාක්ෂාත් කර ගැනීම උදෙසා පළාත් සභාවල අවශ්‍යතාවයක් ඇති බව කියා සිටිති. උතුරු හා නැගෙනහිර වෙසෙන ජනතාව පවා ඔවුන්ට තහවුරු කර දී තිබෙන භාෂා හා අනෙකුත් ව්‍යවස්ථාපිත අයිතිවාසිකම් වලින් තෘප්තිමත්ව සිටිති; පළාත් සභා ඡන්දයක් නොඉල්ලති. ඒ අනුව දෙමළ ජනතාවගේ ගැලවුම්කරුවන් ලෙස පෙනී සිටින කොළඹ ජීවත් වෙන දේශපාලඥයින් කිහිප දෙනෙකු හා ඉන්දියානු -ඇමරිකානු භූ දේශපාලන ඕනෑකම වෙනුවෙන් පෙනී සිටින රනිල් වික්‍රමසිංහ - මහින්ද රාජපක්ෂ ආණ්ඩුව, වංක සහයෝගයෙන් යුතුව රටේ ස්වාධිපත්‍යට අභියෝග කරමින් අප මාතෘ භූමිය අර්ධ යටත් විජිතයක් බවට පත් කිරීමට කූඨ ලෙස සැලසුම් සකස් කරමින් සිටියි. එහිදී ඔවුන් විසින්ම නිර්මාණය කරන ලද රටේ ණයගැතිභාවය ඔවුන්ගේ ප්‍රධානතම ආයුධයක් කරගෙන තිබේ.

ගෝඨාභය රාජපක්ෂ ජනාධිපතිවරයාට ලබාදුන් ජනවරම 13 වන ව්‍යවස්ථා සංශෝධනය සම්පූර්ණයෙන් ක්‍රියාත්මක කිරීමට ලබාදුන් එකක් නොව ඊට එරෙහිව ලබාදුන් එකකි. එසේ තිබිය දී ජනතාවගේ පරමාධිපත්‍ය බලයෙන් පත් නොවුනු හා කිසිදු ජනවරමක් නොමැති රනිල් වික්‍රමසිංහට හෝ මෙම ආණ්ඩුවට 1987 සිට වසර 36ක් තුල ක්‍රියාත්මක නොකල 13 වන සංශෝධනයේ ඇති විධි විධාන පූර්ණ ලෙස ක්‍රියාත්මක කිරීමට නීතිමය හෝ දේශපාලනමය හැකියාවක් හෝ හිමිකමක් හෝ නොමැත. එසේ කළ හැක්කේ ඒ සඳහා විශේෂ ජනවරමක් ලැබුනහොත් පමණී.

අද රට වැටී ඇති ආර්ථික ප්‍රපාතයෙන් ගොඩ ඒම සඳහා දේශීය ආදායම වැඩි කිරීමත්, රාජ්‍ය වියදම අඩු කිරීමත් සිදු කළ යුතු වේ. ඒ සඳහා දේශීය සම්පත් දේශීය ආයෝජකයින් මාර්ගයෙන් දේශීය නිෂ්පාදනය වැඩි කිරීමට යොදා ගැනීමට හැකි පසුබිම සැදිය යුතුය. දේශීය නිෂ්පාදකයින්ට ජාත්‍යන්තර වෙළඳපොල තරණය කිරීමට අවශ්‍ය ක්‍රමෝපාය සකස් කල යුතුය. එහෙත් ජනාධිපති ඇතුලු කැබිනට් මණ්ඩලයේ කිසිවෙකු දේශීය නිෂ්පාදකයා ශක්තිමත් කිරීමට අවශ්‍ය උපායමාර්ගික සැලසුම් කිසිත් මේ දක්වා ඉදිරිපත් කර නොමැත. ජාත්‍යන්තර ශ්‍රේණිගත කිරීම් අනුව කඩා වැටෙමින්

තිබෙන බැංකු ප්‍රතිසංස්කරණය කිරීම සඳහා ද නීති හා පරිපාලන රාමු හෝ උපාය මාර්ගික සැලසුම් හෝ මෙතෙක් ඉදිරිපත් කර නැත. බදු බර හමුවේ අද ජනතාවට මාසික පඩියවත් ගෙදර ගෙනියන්න ඉතිරිවන්නේ නැත. එසේ වුවද රාජ්‍ය වියදම නම් දිනෙන් දිනම වැඩිවෙන බව පෙනී යයි.

අද රටේ පවතින අර්බුදය කළමණාකරණය කිරීමට නොව අඩුම තරමින් එය හරිහැටි අවබෝධ කරගන්නටවත් වත්මන් ජනාධිපති ඇතුලු කැබිනට් මණ්ඩලයට අවම බුද්ධියක් හෝ නොමැත. ආණ්ඩුව අසාර්ථකය. අශක්නුතාවයෙන් පෙලෙන්නේ ය. හුදෙක් කවුරුන් හෝ ණයක් ලබා දී ආණ්ඩුව ගළවාගනියි යන බලාපොරොත්තුවෙන් හිඟමනේ යාමත්, ජනතාවට අයිති ඉතිරි වී තිබෙන කුමන හෝ දේශීය සම්පතක් විකුණාගෙන එදා වේල පිරිමසා ගැනීමත් ඊනියා මන්දබුද්ධික ආණ්ඩුවේ ආර්ථික න්‍යාය වී ඇත.

කලදුටු කල එයින් උපරිම ප්‍රයෝජනය ගැනීමට ඉන්දියාව පසුබට වී නොමැත. එදා සිට ඔවුන්ගේ කුරුමාණමට ලක්ව තිබෙන ත්‍රිකුණාමලයේ පිහිටි තෙල් ටැංකි සංකීර්ණය අද බලශක්ති නිශ්පාදන කේන්ද්‍රයක් කිරීමට ඉන්දියාව මාන බලමින් සිටියි. මේ අතර ඊනියා බලශක්ති නිශ්පාදනයට යැයි පවසමින් උතුරේ දූපත් හා භූමිය ඉන්දීය ආයෝජකයින්ට ලබා දීමට වත්මන් දීන ආණ්ඩුව සැලසුම් කර ඇත. විවිධ හේතු කියාපාමින් ත්‍රිකුණාමලයේ තෙල් ටැංකි පිහිටි භූමිය අල්ලා ගැනීම හරහා එහි පිහිටි වරාය සුක්ෂම ලෙස අත්පත් කර ගැනීමේ සැලසුම මගින් අප ඉන්දීය-ඇමරිකානු ආක්‍රමණයකට ලක්ව ඇත. මේ සියල්ල සිදුවෙන්නේ ඇමරිකානු හා ජපන් නාවුක හටයින් ශ්‍රී ලංකා නාවුක හමුදාව සමග හවුල්ව ත්‍රිකුණාමල වරාය ද යොදාගනිමින් අප මුහුදු කලාපයේ පුහුණුවීමේ මෙහෙයුමක් ක්‍රියාත්මක කර ඇති පසුබිමකය. මේ අතර කොළඹ පිහිටි විශේෂ ගොඩනැගිලි, ඉඩම් පමණක් නොව ඛණිජ නිධි ද, සෙසු වරායන් ද එදා වේල ආර්ථික ප්‍රතිපත්තිය මත විදේශයන්ට විකිණීමට ආණ්ඩුව විසින් පිඹුරුපත් සකසා ඇත. එය පාපයකි. ඒ සඳහා ආණ්ඩුවට ව්‍යවස්ථාමය අයිතියක් නොමැත.

දේශීය සම්පත් දේශීය කර්මාන්ත හරහා ජාත්‍යාන්තර වෙළඳ පොළ ඉල්ලුමට අනුව ගුණාත්මක වර්ධනයකට ලක්කර අපනයනය කිරීමෙන් ආදායම් ලැබීමට හැකියාව තිබිය දී දේශීය නිශ්පාදකයා හා සම්පත් විනාශ වී යන ආකාරයේ ආර්ථික ප්‍රතිපත්තියක් හා සැලැස්මක් රටතුළ ක්‍රියාත්මක කර තිබේ.

13 වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය පූර්ණ වශයෙන් ක්‍රියාත්මක කළහොත් උතුරු නැගෙනහිර පිහිටි භූමිය හා සම්පත් ඉන්දියාවේ සෘජු ග්‍රහණයට ලක්වීම වැලැක්විය නොහැකිය. උතුරු පළාත් සභාවේ පාලන බලතල ලැබී තිබියදීත් එහි වෙසෙන ජනතාවට කිසිදු සේවයක් නොකළ ටී.එන්.ඒ.සභිකයෝ ද කිසිදු අඩුවකින් තොරව ඉන්දියාවේ සූරාකෑමේ කොන්ත්‍රාත්තුව ඉටු කිරීම සඳහා පළාත් සභාවට පූර්ණ බලතල ලැබෙන තෙක් බලා සිටිති. ජනවරමක් නොමැති වත්මන් ජනාධිපති, ඉන්දීය විදේශ අමාත්‍යවරයා සමග සාකච්ජා කර ඇත්තේ මෙසේ සම්පත් හා භූමිය ආක්‍රමණය කිරීමේ ඉන්දීය කුමන්ත්‍රණය ඉන්දියාවේ නිර්මාණයක් වන පළාත් සභා යාන්ත්‍රණය හරහා ක්‍රියාත්මක කිරීමට ය.

ඉන්දියාව ශ්‍රී ලංකාවේ සැබෑ මිතුරෙක් නම් කළ යුත්තේ දැනට විසඳී ඇති ජාතික ප්‍රශ්නය නැවත නැවතත් උලුප්පා දක්වමින් ජනතාව භේද කරවමින් භූ දේශපාලනමය හා ආර්ථික වාසි ලබා ගැනීමට උත්සාහ කිරීම නොවේ. එය සදාචාර විරෝධී මෙන්ම සියලු අන්තර්ජාතික නීති වලට හා සම්මුතීන් වලට පටහැනි ක්‍රියාවකී. ඉන්දියාව කළ යුත්තේ රටක් ලෙස නැගී සිටීමට අවශ්‍ය මූල්‍ය, ආර්ථික හා අනෙකුත් උපකාර ශ්‍රී ලංකාවට ලබා දීමයි. එවකට අගමැතිව සිටි සිරිමාවෝ බණ්ඩාරණායක මැතිනිය ඉන්දු-චීන යුද්ධයේ දී එය සමතයට පත් කිරීමට මැදිහත් වී කටයුතු කළ ආකාරය ඉන්දියාවට මතක තිබිය යුතුය.

එබැවින් අප අපගේ දෙමළ හා මුස්ලිම් ජනතාවට දෙන පණිවිඩය නම් 13 වන ව්‍යවස්ථා සංශෝධනය ක්‍රියාත්මක කිරීමෙන් සිදුවෙන්නේ රටේ ජනතාව අතර අසමගිය ඇති වීමත් අප සියල්ලන්ම සූරාකෑමට ලක්වීමත් පමණී. මේ රටේ සෑම බිම් අඟලක්ම සෑම ජන කොට්ඨාශයකටම අයත් බව පසක් කරමින් ජනතාවට එරෙහිව ගොඩනැගෙන මෙම දේශීය හා විදේශීය බලවේග පරාජය කිරීමට

ජාති, ආගම් හා පක්ෂ බේදයකින් තොරව අප සියලුදෙනාම එක් බලවේගයක් ලෙස පෙරට ආ යුතු බව අවධාරණය කරමු.

එබැවින් අප මෙම ජනවරම අහිමිකරගත් ජනතා විරෝධී ආණ්ඩුවට හා ජනවරමක් නොමැති ජනාධිපතිවරයාට මෙසේ බල කර සිටිමු.

(අ). 13 වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව ජනමත විචාරණයකින් තොරව පූර්ණ වශයෙන් ක්‍රියාත්මක නොකරනු!

(ආ). දේශීය සම්පත් හා භූමිය විජාතිකයින්ට විකිණීම හෝ දීර්ඝකාලීනව බදුදීම වහාම නතර කරනු!

(ඇ). දේශීය ආයෝජකයින්ට, කාර්මාන්තකරුවන්ට, නිෂ්පාදකයින්ට හා ව්‍යාපාරිකයින්ට හිතකර හා යෝග්‍ය වන පරිදි ආර්ථික හා බැංකු ප්‍රතිපත්ති, මූලධර්ම, නීති හා රෙගුලාසි සංශෝධනය කර ක්‍රියාත්මක කරනු!

(ඈ). දේශපාලකයින් හා නිලධාරීන් විසින් පසුගිය වසර 15 පුරාවට සිදුකර ඇති දූෂණ හා බදු වංචා කිරීම් හරහා රටට නැතිවූ ධනය හා සම්පත් නැවත ලබා ගැනීමටත්, දූෂිතයින්ට හා වංචනිකයින්ට එරෙහිව නීතිය ක්‍රියාත්මක කිරීමටත් වහා පියවර ගනු!

(ඉ). දේශීය භාණ්ඩ හා සේවා අපනයන සමාගම් විසින් විදේශයන් හි සඟවා ඇති විදේශ විනිමය මෙරටට වහාම ගෙන්වා ගැනීම සඳහා නීතිය ක්‍රියාත්මක කරනු!

(ඊ). ව්‍යවස්ථාවට අනුව කාලය එළඹී වහාම පාර්ලිමේන්තුව විසුරුවා හැර නිසි ජන වරමක් ඇති ආණ්ඩුවක් පිහිටුවීම සඳහා මහ මැතිවරණයක් හා ඉන් අනතුරුව ජනාධිපතිවරණයක් පවත්වනු!

වර්ෂ 2023ක්වූ ජනවාරි මස 28 වන දින දීය.


පූජ්‍ය ඇල්ලේ ගුණවංස මහාස්ථවිර
ධම්‍යතනයාධිපති
381, බෞද්ධාලෝක මාවත,
කොළඹ 07.

ශ්‍රී සයද්ධානන්ද ධර්මායතනාධිපති
දේශප්‍රේමී භික්ෂු පෙරමුණේ ලේකම්
ජාතික භික්ෂු සංවිධානයේ සභාපති
පූජ්‍ය බෙංගමුවේ නාලක අනුනායක ස්ථවිර
ගැමුණු මාවත, දූම්රිය පාර, කැලණිය.
දු.අංක : 0112 910 146 / 0718 294 353
වි.ලිපිනය : bbnalaka@gmail.com

Nalaka Jayaweera

MAURA GUNAWANSHA
(LL.B. SRI LANKA)
PRESIDENT'S COUNSEL

Dharshana Weraduwage
LL.B, DFMS (Colombo), DIT (IBSL),
H. Dip (C.S.E), Dip (Logistics), CDM.
Attorney-at-Law (A22834)
Astute Law Offices,
No 172, Hulftsdorp Street, Colombo-12.
Tel: 0715 - 99 99 77 Or 0773 - 673 629

R.A.R.N. RUPESINGHE
Attorney-at-Law
Notary Public &
Commissioner for Oaths
No. 135/1, S.de.S. Jayasinghe Mawatha,
Kohuwala, Nugegoda.